# හිතෛෂිවන්තයා /හිතවතා

සිවිල් සමාජ සංවිධාන (CSO) /

රාජ්‍ය නොවන සංවිධාන (NGO)/

පීඩාවට පත් පාර්ශවයේ නීතිඥයෝ



GENDER JUSTICE & SECURITY
A GCRF HUB

# හැඳින්වීම

මෙම මාර්ගෝපදේශ අදාළ වන්නේ

a) ස්ත්‍රී/ සමාජ පුරුෂ භාවය මත පදනම් වූ ලිංගික ප්‍රචණ්ඩත්වයේ වින්දිත-ශේෂිතයන් (Victim-Survivors),

b) පැමිණිලි සටහන් තබන පොලිසිය,

c) වෛද්‍ය පරීක්ෂණ කරනු ලබන අධිකරණ වෛද්‍ය නිලධාරීන්,

d) ශේෂිතයාට සහාය ලබාදෙන හිතෛෂිවන්තයා, මානව හිමිකම් නීතිඥයා හෝ සංවිධානයටයි.

මේ වෙනස් කණ්ඩායම් හතරේ ප්‍රයෝජනය උදෙසා මාර්ගෝපදේශ හතරකට බෙදා ඇත. පැමිණිල්ලට අදාළව වෛද්‍ය සහ නීතිමය ක්‍රියාවලිය ඔවුන් වෙතින් ලබාගත හැකිය.

ශ්‍රී ලංකාවේ ලිංගික හා ස්ත්‍රී - පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය (SGBV) ඉහල අගයක් ගනී. 2020දී පමණක් ව්‍යවස්ථාපිත දූෂණ (වයස අවුරුදු 16ට අඩු ගැහැනු ළමුන් දූෂණය කිරීම්) සිද්ධි 1391ක් සහ ස්ත්‍රී දූෂණ (වයස අවුරුදු 16ට වැඩි කාන්තාවන් දූෂණය කිරීම්) 257ක් පොලිසියට වාර්තා වී ඇත. (https://www.police.lk/wp-content/uploads/2023/07/GRAVE-CRIME-ABSTRACT-FOR-WHOLE-ISLAND-FROM-01.01.2022-TO-31.12.2022.pdf බලන්න.)

එමෙන්ම ලිංගික හිංසන සිදුවීම් සම්බන්ධ ගැටුම් කිහිපයක වාර්තා ඇත. (Woodworth A, and Foìeka B. 2016. ශ්‍රී ලංකාවේ ලිංගික ප්‍රචණ්ඩත්වය ආශ්‍රිත ගැටුම්වලට ගොදුරු වූවන් සඳහා වගවීම සහ වන්දි ගෙවීම. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය. https://www.cpalanka.org/wp-content/uploads/2016/07/CSV-paper-June-2016.pdf)

GENDER JUSTICE & SECURITY
A GCRF HUB

වයස අවුරුදු 16 ට වැඩි කාන්තාවන් දූෂණය කිරීමේ අපරාධ 2020 සිට 2021 වන විට අපරාධ 300 සිට 256 දක්වා අඩු වී ඇත. 2022 වසරේ වාර්තා වූ සිද්ධි සංඛ්‍යාව 257කි. අපරාධ විසඳීමේ ප්‍රතිශතය සැලකිල්ලට ගත් විට 2020 වසරේ විසඳුම් ප්‍රතිශතය 94%ක් වූ අතර, 2021දී විසඳුම් ප්‍රතිශතය 96%ක් එනම්, 15 %කින් ඉහළ ගොස් ඇත. මේ ප්‍රතිශතය 2022 දී 92%ක නිශ්චිත අඩුවීමක් පෙන්නුම් කර ඇත.

වයස අවුරුදු 16ට අඩු වින්දිතයාගේ කැමැත්ත මත වන දූෂණ යටතේ වාර්තා වන වැඩිම අපරාධ සංඛ්‍යාව සලකා බැලීමේදී පහත දැක්වෙන ආකාරයට වසර තුනේදීම එහි වැඩිවීමක් සිදුව ඇත.

2020 දී අපරාධ 1292 ක් වාර්තා වී ඇත; ඊට සාපේක්ෂව 2021 දී අපරාධ සංඛ්‍යාව 1377ක් දක්වා වැඩි වී ඇත. 2022 දී එය 1391ක් දක්වා වැඩිවීමක් සටහන් කර ඇත. මෙම අපරාධ විසඳීමේ ප්‍රතිශතය 2020 දී 98%ක් සහ 2021 සහ 2022 දී අනුපිළිවෙළින් 97%ක් සහ 96% කි.

2020 වෂර්යේදී බරපතල ලිංගික අපයෝජන සිද්ධි 677ක් වාර්තා වී ඇති අතර, ඊට සාපේක්ෂව 2021 දී එම අපරාධ සංඛ්‍යාව 649 දක්වා අඩු වී ඇත. එය 2022 දී 571 දක්වා පහළ වැටී ඇති අතර, විසඳීමේ ප්‍රතිශතය ද 2021 දී 96% සිට 2022 වන විට 95% දක්වා අඩු වී ඇත. (https://parliament.lk/uploads/documents/paperspresented/1689659159014196.pdf)

2024 ජනවාරි 04 සිට මාර්තු 10 දක්වා ශ්‍රී ලංකා පොලිසියේ ළමා හා කාන්තා අපයෝජන වැළැක්වීමේ කාර්යාංශයේ ස්ථාපිත විශේෂ ඒකකයට '109' අංකය හරහා කාන්තාවන් හා ළමයින්ට එරෙහි අපයෝජන, ප්‍රචණ්ඩත්වය සහ හිරිහැර කිරීම් සම්බන්ධ පැමිණිලි 1,077ක් ලැබී ඇත. (https://www.adaderana.lk/news.php?nid=98185 )

GENDER JUSTICE & SECURITY
A GCRF HUB

ශ්‍රී ලංකාවේ ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ සත්‍ය සිදුවීම් පොලිසියට වාර්තා වූ ප්‍රමාණයට වඩා වැඩිය. ඒවා වාර්තා නොකිරීමට බොහෝ හේතු තිබුණත්, ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ පර්යේෂණවල දී සහ දිවි ගලවා ගත් අය සමඟ සාකච්ඡා කිරීමේ දී හෙළි වූයේ, දිවි ගලවා ගත් අයෙකු අනුගමනය කළ යුතු ක්‍රියාවලියේ හිඩැස් සහ මෙම ක්‍රියා පටිපාටි පිළිබඳ දැනුවත්භාවය නොමැතිකමයි.

තමන්ට මුහුණදීමට සිදු වූ හිංසනය හේතුවෙන් දැනටමත් කායික හා මානසික පීඩාවෙන් පෙළෙන ශේෂිතයන්ට මෙමඟින් තවත් දුෂ්කරතා රැසකට මුහුණ දීමට සිදු වේ.

එබැවින් හිතෛෂිවන්තයකු යනු (පවුලේ සාමාජිකයකු, වැඩිහිටි මිතුරකු, නීතිඥයකු, මානව හිමිකම් වෙනුවෙන් පෙනී සිටින්නකු හෝ රාජ්‍ය නොවන සංවිධානයක්, සිවිල් සමාජ සංවිධානයක් හෝ කාන්තා සංවිධානයක්) ශේෂිතයා වෙනුවෙන් පෙනී සිටින, ශේෂිතයාට විශ්වාසය තැබිය හැකි වැදගත් පුද්ගලයෙකි. එම හිතෛෂිවන්තයා, ශේෂිතයා පැමිණිලි කිරීමේ අවස්ථාවේ දී සිට උසාවි කටයුතු ක්‍රියාවලියේ දී සහ ඉන් පසුවත් ඔහු හෝ ඇය සමඟ රැඳී සිටීම වැදගත්ය.

මෙම මාර්ගෝපදේශ, ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතියට ශේෂිතයා ප්‍රවේශ වීමේදී ඒ සඳහා හිතෛෂිවන්තයාට සහාය විය හැකි ආකාරය ගැ පිළිබඳව පියවරෙන් පියවර ඉදිරිපත් කරයි.

# සිදුවීම් සහ ක්‍රියාපටිපාටි

# පළමු පියවර

**සිද්ධිය සම්බන්ධයෙන් තොරතුරු ලබාගත හැකි පුද්ගලයින් :**

- ශෝෂිතයා/ වින්දිතයා
- ග්‍රාම සේවා නිලධාරි (GSO)
- කාන්තා සංවර්ධන නිලධාරිවරිය (WDO)
- ග්‍රාමීය කාන්තා බල මණ්ඩලය
- පරිවාස නිලධාරි
- සමාජ සේවා නිලධාරි
- පවුලේ සාමාජිකයන්
- ප්‍රජා/ ආගමික නායකයන්
- අසල්වාසීන්
- සිද්ධි කළමනාකරු (සිද්ධි කළමනාකරු යනු සේවා පරාසයකින් නඩුව කළමනාකරණය කිරීමට පත් කරන ලද පුද්ගලයෙකි. මෙයට උපදේශකයකු ද ඇතුළත් විය හැකිය.)



- සිදුවීම ශේෂිතයාට හිතෛෂිවන්තයකු ලෙස ක්‍රියා කිරීමේ හැකියාව ඇති, ඉහත සඳහන් කළ ඕනෑම අයකුට වාර්තා කළ හැකිය.

- එවැනි හිතෛෂිවන්තයකුට ශේෂිතයා වෙනුවෙන් සිද්ධිය පොලිසියට වාර්තා කළ හැකිය

- බරපතල ප්‍රචණ්ඩ ක්‍රියාවක් සිදු කර ඇත්නම් (තුවාල ආදිය සඳහා වෛද්‍ය ප්‍රතිකාර අවශ්‍ය නම්) ශේෂිතයා රෝහලකට ඇතුළත් කර ඔහුට/ඇයට අවශ්‍ය ප්‍රතිකාර ලබා දීමට කටයුතු සලස්වන්න.

- හැකි ඉක්මනින් පොලිසියට පැමිණිල්ලක් කිරීමට ශේෂිතයාට සහාය වන්න. මෙහිදී අපරාධය සිදු වූ ස්ථානයට ආසන්නයේම ඇති පොලිස් ස්ථානයට පැමිණිල්ල කිරීමට වගබලා ගත යුතුය.



# පළමු පියවර







1. සාක්ෂි ආරක්ෂා කර ගැනීමේ වැදගත්කම පිළිබඳව ශෝෂිතයාට උපදෙස් දෙන්න.
2. අධිකරණ වෛද්‍ය නිලධාරි විසින් වෛද්‍ය පරීක්ෂණයට ලක් කිරීමට පෙර ශරීරය සෝදා පිරිසුදු කර නොගෙන සිටින්නැයි දැනුවත් කරන්න.
3. අපරාධය සිදු වූ අවස්ථාවේ ශෝෂිතයා ඇඳ සිටි ඇඳුම් එකතු කර ගැනීමටත් (ඒවා නොසෝදා කඩදාසි බෑගයක දමා හෝ කඩදාසියකින් ඔතා තබන්න.)
4. අපරාධකරු සමඟ සම්බන්ධයක් ඇති වෙනත් ඕනෑම සාක්ෂියක් එකතු කර ගැනීමටත්, (උදා: කොන්ඩම්, උපාංග, කෙටි පණිවුඩ, ශරීර තරල පිස දැමීමට භාවිත කළ රෙදි ආදිය) පොලිසියේ පැමිණිල්ලක් කිරීමට අවශ්‍ය ලියකියවිලි එකතු කර ගැනීමටත් ශෝෂිතයාට සහාය වන්න. (ජාතික හැඳුනුම්පත, අදාළ නම් විවාහ සහතිකය ආදී දේ)

# පොලිස් පැමිණිලි පටිපාටිය




පොලිසියට පැමිණිල්ලක් කළ හැකි විවිධ ක්‍රම පිළිබඳ ශේෂිතයා දැනුවත් කරන්න. එනම්,

1. දුරකථන ඇමතුමක් මඟින්,
2. ෆැක්ස් මඟින්,
3. ලිපියකින්
4. පොලිස් ස්ථානයට පැමිණීමෙන්
5. අන්තර්ජාලය හරහා, https://gic.gov.lk/gic/index.php/en/component/complaints/?id=479&task

වරදක් සම්බන්ධයෙන් ඕනෑම තොරතුරක් වාචිකව හෝ ලිඛිතව පොලිස් නිලධාරියකුට ලබා දිය හැකිය. (අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 109 (1) වගන්තිය)

ශේෂිතයා විසින් පුද්ගලිකව හෝ ඔවුන් වෙනුවෙන් වෙනත් පුද්ගලයකුට හෝ පැමිණිල්ලක් කළ හැකි බවට උපදෙස් දෙන්න. අදාළ පොලිස් ස්ථානයේ කාන්තා හා ළමා අපචාර සම්බන්ධයෙන් වන කාර්යාංශය වෙත මෙම පැමිණිල්ල ඉදිරිපත් කළ හැකිය. පොලිස් පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමෙන් පසුව, විධිමත් ක්‍රියා පටිපාටිය පිළිබඳවත් ශේෂිතයාට පැහැදිලි කරන්න.

ශේෂිතයා තර්ජනයට ලක්ව ඇත්නම් ඇයව/ඔහුව ආරක්ෂිත ස්ථානයකට ගෙන යෑමට කටයුතු යොදන්න. ඔබේ ප්‍රදේශයේ කාන්තා/මානව හිමිකම් සංවිධානයකට එවැනි ආරක්ෂිත නිවෙසක් ලබාදීමටත්, ශේෂිතයා සිටින ස්ථානයට ආහාරපාන ප්‍රවාහනය කිරීමටත් හැකියාවක් ඇත.

- රාජ්‍ය තොරතුරු කේන්ද්‍රය පවසන්නේ එවැනි ස්ත්‍රී දූෂණයක් සිදුවුවහොත්, ශේෂිතයාගේ ප්‍රතිලාභය වෙනුවෙන් හැකි ඉක්මනින් පැමිණිල්ල ඉදිරිපත් කළ යුතු බවයි.
- ශේෂිතයා සතුව ඇයට/ඔහුට අවශ්‍ය සියලුම සාක්ෂි සහ ලියකියවිලි තිබේදැයි පරීක්ෂා කරන්න. අවශ්‍ය වුවහොත් ශේෂිතයා සමඟ පොලිස් ස්ථානයට යන්න.
- පැමිණිල්ල ඉදිරිපත් කිරීමේදී ශේෂිතයා පහසුවෙන් සිටින්නේදැයි සැකහැර දැනගන්න.
- පැමිණිල්ලක් සිදු කිරීම වෙනුවෙන් කිසිම ගාස්තුවක් අය නොකෙරේ.
- **ශේෂිතයාට වැටහෙන භාෂාවකින් පැමිණිල්ල සටහන් කර ඇති බවට ස්ථිර වන්න. ශේෂිතයාගේ මුල් බස කතා කරන පොලිස් නිලධාරියකු පොලිසිය සතුව නැතිනම්, පැමිණිල්ල සටහන් කිරීමට කැමති භාෂාව කතා කළ හැකි පොලිස් නිලධාරියකු අසල පිහිටි පොලිස් ස්ථානයකින් ගෙන්වාදෙන ලෙසට ඉල්ලීමක් කරන්න.**




- ශේෂිතයාට පැමිණිල්ල ලබාදීමට අවශ්‍ය භාෂාව කතා කරන කිසිඳු නිලධාරියකු සොයාගත නොහැකි නම් පමණක් පැමිණිල්ල ලිඛිතව ඉදිරිපත් කරන්න. එසේත් නැත්නම් අදාළ නිලධාරියා ප්‍රධාන භාෂාවකින් පැමිණිල්ල සටහන් කළ පසු එය ශේෂිතයාට වැටහෙන භාෂාවකින් නැවත පරිවර්තනය කළ යුතු බව මතක තබාගන්න. මෙය අපරාධ නඩු විධාන සංග්‍රහයේ 109 (2) වගන්තියේ සහ 110 වගන්තියේ අවශ්‍යතාවක් ලෙස පැහැදිලිවම දක්වා ඇත.



- පොලිසිය පැමිණිල්ල භාරගැනීම ප්‍රතික්ෂේප කරන්නේ නම්, ශේෂිතයා බිය ගැන්වීමට හෝ පැමිණිල්ල සිදු කිරීමට එරෙහිව උපදෙස් දෙන්නේ නම් ශේෂිතයාට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට (HRCSL) පැමිණිල්ලක් කළ හැකි බවට උපදෙස් ලබාදෙන්න.

- එසේම මාර්ගගත ක්‍රමය යටතේ 'ටෙල් අයිජීපී'(Tell IGP) භාවිත කරමින් පොලිස්පතිට ලියාදැන්විය හැකිය. එවිට පැමිණිල්ලේ සාක්ෂි රඳවා තබාගත හැකිය. (ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා වාර්තාව බලන්න.): https://www.hrcsl.lk/make-a-complaint/‘Tell IGP’: https://www.telligp.police.lk/)

අපරාධ නඩු විධාන සංග්‍රහයේ 109 (4) සහ (5) මෙන්ම 22 වැනි වගන්තිය යටතේ පැමිණිල්ලක් සටහන් කර, විමර්ශනයක් ආරම්භකර මහේස්ත්‍රාත්වරයා වෙත වාර්තා කිරීමට පොලිසියට ව්‍යවස්ථාපිත වගකීමක් ඇති බවත් දැනුවත් වන්න.

- ශේෂිතයාට ශ්‍රවණාබාධ හෝ කතන ආබාධ ඇති අවස්ථාවලදී හිතෛෂිවන්තයාට සංඥා භාෂා පරිවර්තකයෙකු රැගෙන යෑමට හැකියාවක් ඇත.

- දැනට එවැනි සංඥා භාෂා පරිවර්තකයෙකු සැපයීමට පොලිසියට ව්‍යවස්ථාපිත අවශ්‍යතාවක් නැති අතර, සංඥා භාෂා පරිවර්තකයෙකු සිටීම පොලිස් ස්ථානාධිපතිවරයාගේ අභිමතය පරිදි තීරණය වේ.

# වෛද්‍ය පරීක්ෂණය



# වෛද්‍ය පරීක්ෂණය




- පොලිස් පැමිණිල්ල ඉදිරිපත් කිරීමෙන් පසුව ඇය/ඔහු අධිකරණ වෛද්‍ය නිලධාරිවරයෙකු (JMO) විසින් වෛද්‍ය පරීක්ෂණයකට ලක් කරන බවට ශේෂිතයාට උපදෙස් ලබාදෙන්න.
- පොලිසිය විසින් ශේෂිතයා අරක්ෂා සහිතව කැඳවාගෙන යා යුතුය. අවශ්‍ය නම් පමණක් ශේෂිතයා රෝහලට ඇතුළත් කළ යුතුය. ශේෂිත පුද්ගලයා පරීක්ෂණ සඳහා අධිකරණ වෛද්‍ය නිලධාරි කාර්යාලයට යොමු කරනු ඇත.
- සාක්ෂි ලබා ගැනීමට අපරාධකරුවා වෙනම අධිකරණ වෛද්‍ය නිලධාරිවරයා වෙත රැගෙන ගොස් වෛද්‍ය පරීක්ෂණයට ලක් කළ යුතු බව ශේෂිතයාට පැහැදිලි කරන්න. පොලිසිය විසින් සැකකරු රැගෙන යන වාහනයේම ශේෂිත පුද්ගලයාව ද රැගෙන නොයන ලෙසට වගබලා ගන්න.
- ශේෂිත පුද්ගලයා වෛද්‍ය පරීක්ෂණයට ලක් කිරීමට ඔහුගේ/ඇයගේ භාරකරු ලිඛිතව කැමැත්ත ලබා දිය යුතු බවට ශේෂිත පුද්ගලයාට උපදෙස් දෙන්න.
- ඔහු/ඇය ඊට කැමැත්ත නොදෙන්නේ නම් අධිකරණ වෛද්‍ය නිලධාරිවරයෙකුට වෛද්‍ය පරීක්ෂණය කරගෙන යැමට පොලිසිය විසින් මහේස්ත්‍රාත්වරයාගෙන් නියෝගයක් ඉල්ලා සිටීමට හැකි බවට ශේෂිතයාට කරුණු පහදන්න.




ශ්‍රී ලංකාවේ අධිකරණ වෛද්‍ය විද්‍යාඥයින්ගේ විද්‍යාලය විසින් හඳුන්වා දෙන ලද අධිකරණ වෛද්‍ය අරමුණු සඳහා ලිංගික අපයෝජනයට ලක් වී ශේෂිත පුද්ගලයන්ගේ පරීක්ෂණ, වාර්තා කිරීම සහ කළමනාකරණය සඳහා වන ජාතික මාර්ගෝපදේශය (2014)

# කැමැත්ත සහ වෛද්‍ය නීති පරීක්ෂණය

- ශේෂිතයා වයස අවුරුදු 16ට අඩු නම් මවුපියන්ගෙන්, භාරකරුවන්ගෙන් හෝ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ හෝ පරිවාස සේවා නිලධාරියකුගෙන් කැමැත්ත ලබාගෙන ඇති බවට සහතික වන්න.
- ශේෂිත පුද්ගලයා වයස අවුරුදු 16ට වැඩි නම් සහ කැමැත්ත ලබාදීම ප්‍රතික්ෂේප කරන්නේ නම්, සාක්ෂි ලබා ගැනීම සඳහා කෙරෙන වෛද්‍ය පරීක්ෂණයේ වැදගත්කම ඔහුට/ඇයට පැහැදිලි කර, සාර්ථක නීතිමය ක්‍රියාවලියකට යොමු වීමට සහය වන්න.
- අධිකරණ වෛද්‍ය නිලධාරි විසින් පරීක්ෂණයට පෙර ශේෂිතයාගෙන් වලංගු සහ දැනුවත් කැමැත්ත ලිඛිතව ලබාගන්නා බවට සහතික වන්න. මෙය අනිවාර්ය වේ.
- ශේෂිතයා ඔසප් දින ගත කරන්නේ නම් එවිටත් අධිකරණ වෛද්‍ය නිලධාරිවරයාට සාක්ෂි ලබාගත හැකිය. (සපාකෑම් ලකුණු සහ සීරීම් වැනි දෑ)
- සවිස්තරාත්මක පරීක්ෂණයක් පැවැත්වීම සඳහා ඇගේ, ඔසප් දින අවසන් වූ පසුව පැමිණෙන ලෙස අධිකරණ වෛද්‍ය නිලධාරි විසින් ඇයට දැනුම් දිය යුතුය.




· *(වෛද්‍ය නීතිමය අරමුණු සඳහා ලිංගික අපයෝජනයට ලක්වූවන්ගේ පරීක්ෂණ, වාර්තා කිරීම සහ කළමනාකරණය සඳහා වන ජාතික මාර්ගෝපදේශ (2014) බලන්න. (ශ්‍රී ලංකාවේ අධිකරණ වෛද්‍ය විද්‍යාඥයන්ගේ විද්‍යාලය විසින් මෙය හඳුන්වා දී තිබේ.)

GENDER JUSTICE & SECURITY A GCRF HUB

- පොලිසිය විසින් වෛද්‍ය නීති පරීක්ෂණ පෝරමය (MLEF) (කොටු 1 සිට 8 දක්වා) පුරවා වෛද්‍ය පරීක්ෂණය ආරම්භ කිරීමට පෙර එය අධිකරණ වෛද්‍ය නිලධාරිවරයා වෙත භාර දිය යුතුය.

- අධිකරණ වෛද්‍ය නිලධාරි විසින් කොටු 9 සිට 22 දක්වා පිරවිය යුතුය.

- අධිකරණ වෛද්‍ය නිලධාරිවරයා විසින් වෛද්‍ය පරීක්ෂණය සිදු කරන අවස්ථාවේදී ශේෂිතයාට තමන්ගේ ආරක්ෂාවට අයකුට කාමරය තුළ රැඳී සිටින ලෙස ඉල්ලා සිටිය හැකිය.

- වත්මන් මාර්ගෝපදේශය වලට අනුව මේ රැඳී සිටින පුද්ගලයා පුහුණු වෛද්‍ය නිලධාරියකු, වින්නඹු මාතාවක් හෝ හෙදියක් විය යුතුය. *


- ශේෂිතයා තමන්ගේ ආරක්ෂාවට සිටින පුද්ගලයා සමඟ පහසුවෙන් සිටින බවට සහතික කරගන්න.




* (වෛද්‍ය නීතිමය අරමුණු සඳහා ලිංගික අපයෝජනයට ලක්වූවන්ගේ පරීක්ෂණ, වාර්තා කිරීම සහ කළමනාකරණය සඳහා වන ජාතික මාර්ගෝපදේශ (2014) බලන්න. (ශ්‍රී ලංකාවේ අධිකරණ වෛද්‍ය විද්‍යාඥයන්ගේ විද්‍යාලය විසින් මෙය හඳුන්වා දී තිබේ.)

GENDER JUSTICE & SECURITY A GCRF HUB

- වත්මාන මාර්ගෝපදේශ යටතේ වෛද්‍ය පරීක්ෂණයේදී ආරක්ෂාවට අයකු රැඳී සිටීමට කරන ඉල්ලීම සලකා බැලීමට අධිකරණ වෛද්‍ය නිලධාරිවරයා බැඳී සිටියද එයට ඉඩදීමට අත්‍යවශ්‍ය නොවන බවත් කරුණාවෙන් සලකන්න.
- ආරක්ෂාවට රැඳී සිටින්නා විසින් ද කැමැත්ත ලබා දීමේ පෝරමයකට අත්සන් කළ යුතුය.
- ශේෂිතයා කතාබහ කිරීමට නොහැකි තරමේ කම්පනයකට පත්ව සිටින්නේ නම් ඇයව/ඔහුව උපදේශනය සඳහා යොමු කිරීමට අධිකරණ වෛද්‍ය නිලධාරියාට සහයවන්න.
- වෛද්‍ය පරීක්ෂණයට පෙර විශ්වාසය ගොඩනැඟීම සඳහා උපදේශනය ද නිර්දේශ හැකිය.
- මෙම පරීක්ෂණය පුරාවටම ශේෂිතයාගේ ගෞරවය සුරැකීමට ඔබේ උපරිමය යොදන්න



- සම්පූර්ණ පුද්ගලිකත්වයක් (ශ්‍රවණ සහ දෘශ්‍ය) සහ විනිශ්චය රහිත සවන්දීමක් අනිවාර්යයෙන්ම තිබිය යුතුය.
- වෛද්‍ය පරීක්ෂණය සිදු කිරීම සඳහා ශේෂිත පුද්ගලයා සමඟ විශ්වාසය ගොඩනඟා ගැනීමට අධිකරණ වෛද්‍ය නිලධාරිවරයාට සහාය වන්න.
- ශේෂිත පුද්ගලයා වෛද්‍ය පරීක්ෂණයේ යම් අංශයකට එකඟ නොවන්නේ නම්, අධිකරණ වෛද්‍ය නිලධාරිවරයා විසින් එය ලේඛනගත කර ශේෂිතයාට එයට අත්සන් කරන ලෙස ඉල්ලා සිටිනු ඇත.

- ආබාධ සහිත පුද්ගලයකු සඳහා (උදා: සංජානන දුර්වලතා සහිතව) අධිකරණ වෛද්‍ය නිලධාරිවරයා විසින් වෛද්‍ය පරීක්ෂණයට පෙර කැමැත්ත මත නීතිමය ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුය.*
- MLEF යනු ශේෂිතයාගේ වෛද්‍ය නීති පරීක්ෂණය අධිකරණ වෛද්‍ය නිලධාරිවරයා වෙතින් ලබා ගැනීම සඳහා ඉල්ලුම් කිරීමට පොලිසිය විසින් භාවිත කරන පෝරමයයි.
- MLEF යනු පිටු දෙකක ලේඛනයක් වන අතර, එය අපරාධයේ වර්ගය සහ බරපතලකම දක්වයි.
- වෛද්‍ය පරීක්ෂණයෙන් පසුව ශේෂිතයා අධිකරණ වෛද්‍ය නිලධාරිවරයගේ නම සහ තනතුර, පරීක්ෂණය පැවැත්වූ දිනය සහ ස්ථානය සඳහන් රිසිට් පතක් ලබාගන්නා බවට සහතික වන්න.

• (වෛද්‍ය නීතිමය අරමුණු සඳහා ලිංගික අපයෝජනයට ලක්වූවන්ගේ පරීක්ෂණ, වාර්තා කිරීම සහ කළමනාකරණය සඳහා වන ජාතික මාර්ගෝපදේශ (2014) බලන්න. (ශ්‍රී ලංකාවේ අධිකරණ වෛද්‍ය විද්‍යාඥයන්ගේ විද්‍යාලය විසින් මෙය හඳුන්වා දී තිබේ.)

# අධිකරණ ක්‍රියාවලිය

ශෝෂිතයාට අගතියට පත් පාර්ශවයක් ලෙස නීතිඥයකු හරහා අධිකරණයේ පෙනී සිටීමේ අයිතිය ඇත.

මූලාශ්‍රය: 260 වගන්තිය, අපරාධ නඩු විධාන සංග්‍රහය. ජගත්සේන සහ වෙනත් අයට එදිරිව ජී.ඩී.ඩී. පෙරේරා, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පරීක්ෂක සහ සිරිමාවෝ බණ්ඩාරනායක මහත්මිය (අගතියට පත් පාර්ශවය), (1992) 1 SLR 371.



# සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම

- ශෝෂිතයාට තර්ජනයක් එල්ල වී ඇත්නම් සහ ආරක්ෂාව අවශ්‍ය වන්නේ නම් අපරාධ සහ සාක්ෂිකරුවන්ට සහය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත යටතේ කරුණු ඉදිරිපත් කරන්න.
- අපරාධවලට ගොදුරු වූවන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියට, ශ්‍රී ලංකා පොලිසියේ වින්දිතයන් සහ සාක්ෂිකරුවන්ගේ සහය සහ ආරක්ෂක අංශයට හෝ ආසන්නම පොලිස් ස්ථානයට පැමිණිල්ලක් කළ හැකිය.
- නඩුව විභාග කරන අතරතුර හෝ එය අවසන් වූ පසු අධිකරණයෙන් ආරක්ෂාව ඉල්ලා සිටිය හැකිය. (සාමාන්‍යයෙන් සැකකරුට ඇප දීමට විරුද්ධ වීම පොලිසියේ වගකීමකි. නමුත් ශෝෂිතයා වෙනුවෙන් නීතිඥවරයකු අධිකරණයේ පෙනී සිටීම මේ සඳහා වඩාත් වාසිදායකය.)
- ශෝෂිතයාට ලබාගත හැකි සියලුම සාක්ෂි ආරක්ෂණ අයිතීන් ඉල්ලා සිටින බවටත්, සාක්ෂිකරුවන් ආරක්ෂා කීරීමේ නියෝග ක්‍රියාත්මක කරන බවටත් සහතික වන්න.
- නියෝග නොපිළිපදින අවස්ථාවලදී ඒ බව අධිකරණයට දැනුම් දෙන්න.



GENDER JUSTICE & SECURITY
A GCRF HUB

# රහසිගතව සාක්ෂි විමසීම (In-Camera)

- ශේෂිතයාගේ නීතිඥයාට පිටස්තර පුද්ගලයන් නොමැතිව රහසිගතව හෝ මහේස්ත්‍රාත්වරයාගේ කුටිය තුළ ශේෂිතයාගේ සාක්ෂි ලබා දීම සඳහා උසාවියට අයදුම් කළ හැකිය. එවිට ශේෂිතයාගේ පාර්ශවය නියමාකාරයෙන් ඉදිරිපත් කළ හැකිය. (ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 106 (2) ව්‍යවස්ථාව බලන්න
- විනිසුරුවරයකුට ඔහුගේ/ඇයගේ අභිමතය පරිදි ලිංගික කාරණා සම්බන්ධ නඩු ක්‍රියාවලියකදී, එය යෝග්‍ය යැයි හැඟෙන ඕනෑම අවස්ථාවක 'ක්‍රියා පටිපාටියට සෘජුවම උනන්දුවක් නොදක්වන' පුද්ගලයන් බැහැර කළ හැකිය. මෙහිදී අභිමතය විනිසුරුවරයා සතුව ඇති මුත් නීතිඥවරයාට පෞද්ගලික විභාග කිරීමක් ඉල්ලුම් කිරීමේ හැකියාවක් ඇත.
- ශේෂිත පුද්ගලයාගේ පොලිස් නියෝජනය හෝ නඩුව සාවද්‍ය බවක් හැඟෙන්නේ නම් ඒ බව අධිකරණයට දන්වන්න.



# විමර්ශනය / උසාවි ක්‍රියාවලිය

- කිසිම නීතිඥයකු පොලිස් විමර්ශන කණ්ඩායමට බලපෑම් කිරීමට උත්සාහ නොකළ යුතුය. කෙසේ නමුත් විත්තිකරු පොලිසියට බලපෑම් කරන බව දන්නා විට, ඒ බව උසාවියට වාර්තා  කිරීමට හෝ නඩුව ඉහළ අධිකාරියකට පැවරීමට උත්සාහ කරන්න.
- අගතියට පත් පාර්ශවයක් නියෝජනය කරන නීතිඥයකු, වෙනත් කරුණු අතරම, නියමිත වේලාවට නිසි පියවර ගන්නා බවට සහතික විය යුතුය:
    - අවශ්‍ය වූ ඕනෑම විටක ශේෂිතයාගේ ආරක්ෂිත පියවර සුරක්ෂිත කිරීම.
    - අපරාධකරුවන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීමේ/අධිකරණ බලධාරීන් නිවැරැදි චෝදනා සකස් කරන බව සහතික කිරීම සඳහා:
    - අපරාධකරුවන්ට එරෙහිව අනිවාර්ය සිර දඬුවම් පැනවීම සඳහා ඇප දීමට විරෝධය පෑම මෙන්ම එවැනි මැදිහත්වීම් අවශ්‍ය වන විට අධිකරණයට කරුණු දැක්වීම අවශ්‍යවේ. සැකකරු/චූදිතයා ඇප මත මුදා හැරීමෙන් ශේෂිත පුද්ගලයාගේ ජීවිත ආරක්ෂාවට තර්ජනයක් සිදුවන්නේ එවන් අවස්ථාවන්වල දීය.
    - නීතියෙන් සපයා ඇති පරිදි, අගතියට පත් පාර්ශවවලට අපරාධකරු(වන්) විසින් ගෙවිය යුතු උපරිම වන්දිය ඉල්ලා සිටීම:
    - විමර්ශනයේ ප්‍රගතිය, අධි චෝදනාපත්‍ර ගොනු කිරීමේ ක්‍රියාවලිය සහ අධිකරණ ක්‍රියාදාමයේ ප්‍රගතිය නිරීක්ෂණය කිරීමට ශේෂිතයාගේ කාලෝචිත යුක්තිය සඳහා ඇති අයිතිය සහතික කෙරෙයි. (අපරාධ වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වන ජාතික අධිකාරිය පිළිබඳ සබැඳිය බලන්න) https://napvcw.gov.lk/

GENDER JUSTICE & SECURITY A GCRF HUB

# හිතෛෂිවන්තයා සඳහා දියහැකි ප්‍රධාන ඉඟි

- අවශ්‍ය වූ අවස්ථාවක වෙනත් වෘත්තිකයන්ගෙන් වෛද්‍ය ආධාර සහ උපදෙස් ලබා ගැනීමට ශේෂිතයාට උපකාර කිරීම/රුකුල් දීම.
- අගතියට පත් පාර්ශවයේ නීති බලධාරීන් ඇතුළු අදාළ නීතිමය අධිකාරි වෙත ප්‍රවේශ වීමට ශේෂිතයාට සහාය වීම.
- සම්පූර්ණ ක්‍රියාවලිය පුරාම උපදේශනය ලබා ගැනීමට ශේෂිත පුද්ගලයාට සහාය වීම.
- වන්දි ගෙවීමේ කාර්යාල පනත යටතේ වන්දි ගෙවීමේ කාර්යාලය විසින් අර්ථ දක්වා ඇති පරිදි ශේෂිතයා 'අගතියට පත් පාර්ශවය ' යටතට වැටේ නම්, ශේෂිතයාට ආධාර, වන්දි, උපකාර ලබා ගැනීමට වන්දි කාර්යාලය වෙත යොමු කළ යුතුය.



- ශේෂිත පුද්ගලයා වෙනුවෙන් ක්‍රියා කිරීමට නීතිඥයකු පත් කරන්න, නැත්නම් ශේෂිතයාට නීතිඥයකු සොයා ගැනීමට උපකාර කරන්න. නඩු කටයුතු නිරීක්ෂණය කිරීමට සහ ඊට සහය වීමට මෙන්ම අධිකරණයේදී ශේෂිතයාගේ අවශ්‍යතා පිළිබඳ සැලකිලිමත් වන්න.
- අධිකරණ ක්‍රියා පටිපාටිය අදාල  සුදුසු නියෝගවලට අදාළ අයදුම්පත් සහ ලේඛන අධිකරණයට ගොනු කර ඇති බවට සහතික වන්න.
- ඔබ උසාවියට පැමිණ සිටීමෙන් සැකකරුගේ මිත්‍රයන්/ පවුලේ සාමාජිකයන් විසින් උසාවියේදී හෝ උසාවි පරිශ්‍රය ඇතුළත ශේෂිතයාව බිය ගැන්වීමට හෝ හිරිහැරයට ලක් කිරීමට ඇති අවස්ථා අවම කරවයි.
- 2015 අංක 04 දරන අපරාධයේ වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට සහය දැක්වීමේ සහ ආරක්ෂා කිරීමේ පනතේ විධිවිධානවලට අදාළ අවස්ථාවල ශේෂිතයාගේ ආරක්ෂාව සහතික වීමට භාවිත කරන ලෙස නීතිඥවරයාට උපදෙස් දෙන්න.
- ඔබ ශේෂිතයාගේ නීතිඥයා ලෙස පෙනී සිටින්නේ නම්, සිදුවීම පොලිසියට මෙන්ම අධිකරණයට වාර්තා කරන ආකාරය පිළිබඳ සරල භාෂාවෙන් ඇයට/ඔහුට උපදෙස් දෙන්න. ශේෂිතයාට නඩු පවරන්නා (අභිචෝදිකාව) ලෙස උසාවියේ සාක්ෂි ලබා දිය හැකිය. එසේ නැත්නම් ශේෂිතයා වෙනුවෙන් නීතිඥයන් (පැමිණිලි හෝ අගතියට පත් පාර්ශවයේ නීතිඥයා) පෙනී සිටිය හැකිය.
- පොලිස් විමර්ශන කණ්ඩායම සමඟ කතාබහ කර විමර්ශනයේ වත්මන් ප්‍රගතිය පිළිබඳ යාවත්කාලීන වන්න.
- නඩුවට අදාළ සියලුම ලියකියවිලි (ශේෂිතයාගෙන්, පොලිසියෙන් සහ උසාවියෙන්) ලබා ගැනීමෙන් අනතුරුව ඔබ සතු ගොනුවේ ලිපි ලේඛන සකසා ඇති ආකාරය ශේෂිත පුද්ගලයාට පෙන්වන්න.
- අත්‍යවශ්‍ය නම් පමණක් සැකකරුවන්ගේ සහ/හෝ ආශ්‍රිතයන්ගේ නෛතික නියෝජිතයන් සමඟ පමණක් සන්නිවේදනය කරන්න.

- පළමු තොරතුරු ගොනුව සඳහා සිද්ධියට අදාළ සාක්ෂි සහ සාක්ෂිකරුවන්ගේ ලැයිස්තුවක් සකසන්න.

- බී වාර්තාව සහ වැඩිදුර වාර්තා මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කර එම සියලු ලේඛන ශේෂිත පුද්ගලයාට පෙන්වන්න.

- භාෂා ගැටලු මතුවුවහොත් පොලිස් විමර්ශන කණ්ඩායමට සහය වන්න. අවශ්‍ය අවස්ථාවලදී අධිකරණ කටයුතුවලදී අධිකරණ සැරයන්වරයාට සහය වන්න.

- උසාවියට ඇඳීමට සුදුසු ඇඳුම් පැළැඳුම් සම්බන්ධයෙන්, උසාවියේදී අපේක්ෂා කරන හැසිරීම, උසාවියට යැමට පෙර සිදුවන ක්‍රියාවලියේ අනුපිළිවෙළ පිළිබඳ ශේෂිත පුද්ගලයාට සංවේදීව විස්තර කරන්න.



- නඩුව කැඳවන දින උසාවියට පැමිණ ඔබේ පෙනුම සහ ශේෂිතයාගේ පෙනුම යන දෙකම සලකුණු කරගන්න. මහාධිකරණයේදී අධි චෝදනා පත්‍රය කියවන තුරු රැඳී සිටින්න.

- අධි චෝදනා භාර දුන් පසුව නීතිපති දෙපාර්තමේන්තුව නඩුව ඉදිරියට ගෙන යැමට සැලසුම් කරන්නේ කෙසේද යන්න වටහා ගැනීමට අභිචෝදකයා සමඟ සන්නිවේදනය කරන්න.
    - නඩු කටයුතු අඛණ්ඩව අධීක්ෂණය කිරීම, නීතිපති දෙපාර්තමේන්තුව සමඟ සන්නිවේදනය කිරීම සහ නඩුවේ ප්‍රගතිය සම්බන්ධයෙන් ශේෂිත පුද්ගලයාට නිතිපතා යාවත්කාලීන කිරීම.

# නොකළ යුතු දේවල්

- කිසිම අවස්ථාවක ශේෂිත තැනැත්තාගේ **අනුමැතියකින් තොරව, ඔහුගේ හඬ අර්ථ නොදක්වන්න.** එසේම ඔහු/ඇය වෙනුවෙන් ඔහුගේ/ඇයගේ අවසරයකින් තොරව කතා කිරීමෙන් වැළකී සිටින්න.

- **ශේෂිත පුද්ගලයා නැවත කම්පනය නොකරන්න.** අගතියට පත් පාර්ශවයේ නීතිඥයා, අභිචෝදක හෝ විත්තියේ නීතිඥයා විසින් අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු දීමේදී ශේෂිත පුද්ගලයකු නැවත බියට පත් විය හැකි ආකාර පිළිබඳ අවධානයෙන් පසුවන්න. ඒ ගැන සංවේදී වන්න.

- **ශේෂිත පුද්ගලයාට, පොලිස් ස්ථානයට ගෙන ආ හැකි සාක්ෂිකරුවන්ට ඔවුන්ගේ ප්‍රකාශ කළ යුතු ආකාරය පිළිබඳ උපදෙස් නොදෙන්න.**

- නඩුවට අදාළ විය හැකි, ශේෂිත පුද්ගලයා සම්බන්ධ කිසිම රහස්‍ය **කරුණක්, සාක්ෂි හෝ භෞතික කරුණු සම්බන්ධයෙන් විත්තියේ නීතිඥයන් සමඟ තොරතුරු හුවමාරු කර නොගන්න.** මේවා වරප්‍රසාදිත තොරතුරු වන අතර, ශේෂිතයාගේ අනුමැතිය අනිවාර්ය වේ. එබැවින් ඕනෑම අනාවරණයක් ශ්‍රේෂ්ඨාධිකරණ රීතිවලට පටහැනිය. සේවාදායකයාගේ ප්‍රකාශිත අවසරයකින් තොරව සේවාදායකයකුගේ තොරතුරු හෙළිදරව් කළහොත් නීති පරීක්ෂණයකට මුහුණ දීමට නීතිඥයකු බැඳී සිටි.

- ශෝෂිත පුද්ගලයාගේ දැනුවත් අවසරයකින් තොරව ජනමාධ්‍ය ඇතුළු පිටස්තර පුද්ගලයන් සමඟ නඩුව පිළිබඳ කරුණු බෙදා නොගන්න.
- **ශෝෂිත පුද්ගලයා ඉදිරිපිට නඩුව කෙරෙහි උනන්දුවක් හෝ විශ්වාසයක් නැති බවක් හෝ උසාවියේදී නඩුව පිළිබඳ විශ්වාසයක් නොමැතිකමක් නොපෙන්වන්න.**
- කිසිම අවස්ථාවක ශෝෂිත පුද්ගලයාට එරෙහිව කටයුතු නොකරන්න. අගතියට පත් පාර්ශවයේ නීතිඥයා හිතවත් ලෙස ක්‍රියා කරන අවස්ථාවක, කිසියම් හේතුවක් නිසා ඔහු/ඇය නඩුව සම්බන්ධයෙන් අපහසුතාවට පත් වුවහොත්, නඩුව අඩපණ කිරීමෙන් වැළකී නඩු විභාගයෙන් ඉවත් වන්න.

# කණ්ඩායම

- මහාචාර්ය **නෙලූෆර් ද මෙල්**

  (සම අධ්‍යක්ෂ ස්ත්‍රී/පුරුෂ සමාජභාවය සහ ආරක්ෂක මධ්‍යස්ථානය සහ ඉංග්‍රීසි දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය)

- ආචාර්ය **ජීන් පෙරේරා**

  (ජ්‍යෙෂ්ඨ උපදේශක, ව්‍යාධිවේදය සහ අධිකරණ වෛද්‍ය දෙපාර්තමේන්තුව, වෛද්‍ය පීඨය, මොරටුව විශ්වවිද්‍යාලය.

  අධිකරණ වෛද්‍ය හා විෂ විද්‍යා අංශයේ විශ්‍රාමික (සභාපති) මහාචාර්ය , කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව)

- **රනිතා ඥනරාජා**

  (නීතිඥ)

- **සඳනි යාපා අබේවර්ධන**

  (නීතිඥ)

- **හැරී ප්‍රනාන්දු**

  (කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය)

- **රුවංගි අමරසිංහ**

  (ෆෝල්ඩ් මාධ්‍ය සාමූහිකය)